**දේශීය ආදායම් දිරි දීමනා අරමුදල - 2013**

---

දේශීය ආදායම් දිරි දීමනා අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශේෂ පත්‍රය සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරි වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දිරි දීමනා අරමුදලේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ගිණුම්කරණ මූලධර්ම අනුගමනය නොකිරීම**

මූල්‍ය ප්‍රකාශන වල කොටසක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළයුතු වුවත් අරමුදල විසින් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

අරමුදල යටතේ පැවති එකතුව රු.326,119 ක් වූ ක්‍රීඩා භාණ්ඩවලින් ත්‍රස්ත ප්‍රහාරයෙන් විනාශ වී තිබුණු රු.152,400 ක් වූ ක්‍රීඩා භාණ්ඩ කපා හැරීමට භාණ්ඩාගාර අනුමැතිය ලබා දී තිබුණද, පොත්වලින් රු.167,864 ක් වූ ක්‍රීඩා භාණ්ඩ කපාහැරීම හේතුවෙන් රු.15,464 ක් වැඩිපුර කපා හැර තිබුණි.

**2.3** **නිවාස ප්‍රතිලාභ ණය යෝජනා අරමුදල**

නිවාස ප්‍රතිලාභ ණය යෝජනා අරමුදලෙහි වර්ෂය අවසානයට රු.30,059,078 ක ශේෂයක් පැවති අතර, නිවාස ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණයවලින් වාරික හා පොළී අයකිරීම්වලට අදාළව ණය ලබා ගත් අයගේ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

**2.4** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.2 වගන්තිය | ක්‍රියාත්මක නොවන අරමුදල් වසා දැමීමට කටයුතු කළ යුතු වුවත්, 2006 වර්ෂයේ සිට වැය ශීර්ෂ ප්‍රතිපාදනවලින් දිරි දීමනා ගෙවීම නිසා දේශීය ආදායම් දිරිදීමනා අරමුදල ක්‍රියාත්මක අරමුදලක් නොවූයෙන් එම අරමුදල වසා දැමීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ශේෂ පත්‍රයේ දක්වා තිබුණු රු.5,109,075 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වලට අදාළ සියළු විස්තර දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කර නොතිබුණි |

## 2.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂය අවසානයට අරමුදලෙහි ශේෂ පත්‍රයෙහි දක්වා තිබුණු එකතුව රු.5,361,330 ක් වූ ඉඩම් ගොඩනැගිලි, කාර්යාලීය උපකරණ සහ ක්‍රීඩා භාණ්ඩ අරමුදලේ කටයුතු සඳහා භාවිතා නොකරන බැවින් ඒවා දෙපාර්තමේන්තුවට පැවරීමට කටයුතු කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ණය පාලනය

(ආ) ස්ථාවර වත්කම් කළමනාකරණය